# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2159/2 - 2020 ජනවාරි මස 20 වැනි සඳුදා - 2020.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/1978 (iii)

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

44 වන ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාව යටතේ නිවේදනය

උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන විෂයය පවරා ඇති අමාත්‍ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2019 දෙසැම්බර් මස 10 වැනි දින අංක 2153/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර මා වෙත පැවරී ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ I වන, II වන සහ III වන තීරයන්හි නිශ්චිතව සඳහන් වන්නා වූ ද විෂයයන් සහ කර්තව්‍යයන්ට අදාළ බලතල සහ කාර්ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මේ නිවේදනය මගින් 2019 දෙසැම්බර් මස 21 වන දිනැති අංක 2154/55 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර පත් කරන ලද (අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන) තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍ය, තිලංග සුමතිපාල මහතා වෙත පවරමි.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,<br>
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 16 වැනි දින.<br>
කොළඹ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 1. දැනුම පාදක කරගත් ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් වැඩි දියුණු කිරීම හා අදාළ පර්යේෂණ ආයතන සමග මනා සම්බන්ධීකරණයකින් කටයුතු කිරීම. | 1. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය<br>2. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව | 1. 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පනත |


1A - G 31832 — 392 (2020/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*
*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. විද්‍යාත්මක, කාර්මික, සාමාජීය සහ ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

3. සොයා ගැනීම්වලට අදාළ තොරතුරු සහ නැනෝ, රොබෝ, යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික සහ ජෛව තාක්ෂණය ඇතුළු දැනුම මූලික කොටගත් නව පර්යේෂණ සහ සොයා ගැනීම් සම්බන්ධ තොරතුරු, ව්‍යාපාර ප්‍රජාව ඇතුළු අදාළ පාර්ශ්වයන් වෙත ලබාදීම.

4. අදාළ වෙනත් ආයතන සමග සම්බන්ධ වෙමින් නව සොයා ගැනීම් සිදු කිරීමට ප්‍රජාව මෙහෙයවීම සහ ඒ සඳහා ඔවුන් පෙළඹවීම සඳහා අදාළ පියවර ගැනීම.

5. උත්පාදන ආර්ථිකයට සහය ලබාදීම සඳහා ජාතික නවෝත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම, අරමුදල් සැපයීම, උසස් තාක්ෂණික ව්‍යවසායයන් සඳහා පහසුකම් සැලසීම සහ නවෝත්පාදන ව්‍යවසායයන් සම්බන්ධ ආයෝජන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවල කාර්යක්ෂමතාව අධීක්ෂණය කිරීම හා ඇගයීම.

6. විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයන් ප්‍රජාව වෙත හඳුන්වා දීම හා ඒ ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම.

7. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කරමින් ජාතික සංවර්ධන අරමුණු සාධනය සඳහා සක්‍රීය දායකත්වය ලබා දීම.

8. ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණික හා පර්යේෂණ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම හා සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. විවිධ රටවල් සමග ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සහයෝගතාවයන් ඇතිකර ගැනීම මගින්, විද්‍යාව තාක්ෂණය හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික ප්‍රගතිය ඇති කිරීම.

*II වැනි තීරුව*
*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

3. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය

4. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

5. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදල

6. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාංශය

7. නීල හරිත වර්ධක කාර්යාංශය

8. ද්‍රව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය

9. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය

10. විද්‍යාතා මධ්‍යස්ථාන

*III වැනි තීරුව*
*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්*

2. 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත

3. 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත

4. 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත

5. 2019 අංක 22 දරන ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය පනත

02 - 03

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.